




Welcome to LAKRUHUNU BUDDHIST Sri lanka Official Site

**ශ්‍රී. බු. ව. 2554 බිනර මස කලාපය. රා. ව. 2010 ක් වූ සැප්තැම්බර් මස 22 වන දින**

**මාතර, ශ්‍රී සුදර්ශි මහ පිරිවෙන්හි නියෝජ්‍ය පරිවේනාධිපති දෙවිනුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති**

*ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන් වහන්සේ විසිනි.*

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

**ෂද්ධර්මය අතුරුදහන් නොකොට රැකගනිමු.**
**(සංයුත්ත නිකාය - සදධමමපතිරූපක සූත්‍රය ඇසුරිනි.)**

*ධාරුණික පින්වත්නි.*

*අද බිනර පුර පසළොස්වක පොහොය දිනයයි. බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුර නුවරට වැඩමවා තම ඥාතීන් විසින් ඉදිකරවා පූජා කරන ලද නිග්‍රෝධාරාමයෙහි වැඩ සිටි සේක. එතනට පැමිණි මහා ප්‍රජාපතී ගෝතමිය කාන්තාවන්ට පැවිද්ද ලබා දෙන ලෙස ඉල්ලා සිටියාය. තථාගතයන් වහන්සේ තෙවරක්ම එම ඉල්ලීම ප්‍රතික්ෂේපකළ සේක. කිඹුල්වත් නුවරින් පිටත්වූ බුදුන්වහන්සේ විසාලා මහනුවර කූටාගාර ශාලාවට වැඩම කළේ වස් විසීම සඳහාය. රාජකුමාරිකාවන් 500ක් සමග කූටාගාරශාලාවට පැමිණි මහාප්‍රජාපතී ගෝතමිය ආනන්ද හිමියන්ගේ මගපෙන්වීම මත තථාගතයන් වහන්සේගෙන් පැවිද්ද ලබා ගත්තේ අද වැනි බිනර පුර පසළොස්වක පොහොය දිනයක ය. එවැනි උතුම් පොහොය දිනයක මෙම සදහම් පණිවිඩයෙන් අප බලාපොරොත්තු වන්නේ සද්ධර්මය අතුරුදහන් නොකොට ආරක්‍ෂා කරගැනීමේ වැඩ පිළිවෙල ගැන සිහිපත් කර දීමටය.*

*බුදුරජාණන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහි වැඩ සිටිනා අවස්ථාවක එතනට පැමිණි මහාකාශ්‍යප හිමියන් අසා සිටියේ ස්වාමීනි මුල් යුගයෙහි ශික්‍ෂාපද අඩුවෙන් පැවති නමුත් රහත්වූ පිරිස වැඩිය. වර්තමානයේ ශික්‍ෂාපද බොහෝ කොට පනවා තිබූ නමුත් රහත්වන*

පිරිස අඩුය. මීට හේතු කවරේද? ඊට පිළිතුරු දෙමින් තථාගතයන් වහන්සේ වදාළේ සත්වයින් ගුණධර්මවලින් පිරිහෙන කල්හි ශික්ෂාපද වැඩිවන බවත් රහත්වන පිරිස අඩුවන බවත් ය.

තවදුරටත් කරුණු ඉදිරිපත් කරමින් බුදුන්වහන්සේ දේශනා කළේ සද්ධර්මය වැනිවූ දේ (සද්ධර්මය ප්‍රතිරූප) සමාජය තුළ ඇති නොවූවොත් සද්ධර්මය නොපිරිහෙයි. සද්ධර්මය වැනි වූ දේ ඇතිවූවොත් සද්ධර්මය පිරිහෙයි යනුවෙනි. මෙම කාරණය පැහැදිලි කිරීම සඳහා ඉතා වැදගත් උපමාවක් මෙම සූත්‍රයෙහි සඳහන් වේ. කාශ්‍යපයන ලෝකයෙහි රන්බඳු දෙයක් හට නොගනීනම් එතාක් රන් අතුරුදහන් නොවෙයි. යම් කලෙක රන්බඳු දෙයක් හට ගනීනම් රන් අතුරුදහන් වෙයි. මේ පිළිබඳව විස්තර කරන සාරත්ථප්පකාසිනී නම් වූ සංයුක්ත නිකාය අටුවාව මෙසේ සඳහන් කරයි.

"ජාතරූප පතිරූපකං යනු රන් ආලේපකරන ලද පිත්තල ආභරණ ඇතිවීමයි. උත්සව කාලවලදී මිනිස්සු ආභරණ ආදී භාණ්ඩ ගන්නෙමුයි. වෙළඳසැල් වලට යති ඔවුන්ට වෙළඳසැල් හිමියෝ මෙසේ කියති. ඉදින් ඔබලාට ආභරණ අවශ්‍ය නම් මේවා ගන්න. මෙම ආභරණ ඝන වුයේත් වර්ණවත් වුයේත් වේ. වටිනාකම අඩුවේ. ඔවුහු එය අසා අලංකාර වූ අඩු මිලට ගත හැකි ආභරණ ගෙන පළඳිති. ඒ නිසා වැඩිමිල ඇති ඉතා හොඳ රතුන් බඩු සැඟවී යයි . මෙසේ රන් වැනි ආභරණ ඇති වූ කළ රන් ආභරණ සැ!ගවී යයි. (සාරත්ථප්පකාසිනී අටුවාව) අටුවාචාර්‍ය බුද්ධඝෝෂ හිමියන් මෙහිදී ඉතා පැහැදිලිව මේ කාරණය විස්තකර ඇත. නූතනය දෙස බැලුවත් බොහෝ විට තත්වය මෙසේ ය. නියම රන් ඉතා මිළ අධික නිසා බොහෝ දෙනා පළඳින්නේ රන් මෙන් පෙනෙන බොරු රන් භාණ්ඩයෝය . ඒ නිසා ඉතා හොඳ රන් භාණ්ඩ සැගවී ගොස් ඇත. ඉමිටේෂන් භාණ්ඩ කියා කියන්නේ මේවාටය.

ධර්මයටද සිදුවී ඇත්තේ මෙයමය. අද බොහෝ තැන්වලින් ඇසෙන්නේ බණ නොවේ. එවා බණ වැනි බණය. නමුත් එදාට වඩා අද තිබෙන වෙනස එම බණ මිළ අධික වීමයි. ත්‍රිපිටකයේ සඳහන් සූත්‍ර පාඨයක් හෝ ගාථාවක් මාතෘකා කර ගන්නා ඇතැම් ධර්ම දේශකයින් වහන්සේලා ඊට අදාළ කරුණු කිසිවක් නොකියා විවිධ හස්තවිකාර මුඛවිකාර කරමින් පැය පුරාම බණ අසන අය සිනහ ගන්වා දෙවියන්ට පින්දී බණ ඉවර කරති. බණ අසන අය අතර සිටින බණ නොහඳුනන බොහෝ දෙනා නොම්මර එකේ බණ ටිකක් ඇසුවායයි කියමින් ගෙදර යන්නේ එම ඉමිටේෂන් බණවලටය. සූත්‍ර පාඨයක් හෝ ගාථා පාඨයක් දේශනාකොට ඊට අදාළ අටුවා පාඨ විස්තර කරමින් ධර්මයක් දේශනා කළොත් බොහෝ දෙනා අසතුටු වෙති. ඒ බණ නොහඳුනන අයයි . ඒ අතර බණ දන්නා කෙනෙකු සිටියොත් කලකින් නොම්මර එකේ බණක් ඇසුවායි සතුටුවෙයි.

මෙහිදී තථාගතයන් වහන්සේ ඉතා පැහැදිලි ලෙස ධර්මය අතුරුදහන් වීම ගැන කරුණු ඉදිරිපත් කරයි. පඨවි - අපෝ - තේජෝ - වායෝ යන සතර මහ භූතයන් නිසා මේ සද්ධර්මය අතුරුදහන් නොවේ. යම් දිනෙක මේ සසුනෙහි මෝඝපුරිස නමින් හඳුන්වන හිස් පුරුෂයින් උපදීද එදාට ධර්මය අතුරුදහන් වෙයි.

ඉහත කී කාරණය විස්තර කරන බුද්ධඝෝෂ හිමියන් පඨවි ධාතුව යනු දෙලක්ෂ හතළිස් නහුතයකට වඩා ඝනවූ මහා පොළොවයි. ආපෝධාතුව යනු පෘථිවියේ සිට සුභකිණ්හක බ්‍රහ්ම ලෝකය දක්වා නැගෙන කල්පය විනාශ කරන ජලයයි. තේජෝ ධාතුව යනු පොළොව

පටන් ආභස්සර බඹලොව දක්වා නැගෙන කල්ප විනාශ කරන ගින්නයි. වායෝ ධාතු යනු පොළොවේ සිට වෙහෙප්වල බඹලොව දක්වා කල්පය විනාශ කරන වායුවයි. මේ එකකින් වත් ධර්මය අතුරුදහන් කළ නොහැකිය නමුත් මේ සසුන හඳුනානොගත් හිස් පුරුෂයින්ගෙන් මේ ධර්මයඅතුරුදහන් විය හැකිය. වර්තමානයේ මේ තත්වය ඉතා දරුණු ලෙස ක්‍රියාත්මක වන නිසා සද්ධර්ම ප්‍රතිරූපක හිස් මිනිසුන් හඳුනාගෙන සද්ධර්මය ආරක්ෂා කර ගැනීම ධර්මකාමී හැමදෙනාගේම යුතුකම හා වගකීම වේ.

මීට අවුරුදු 10 කට 15 කට වඩා ඉහත දී ගුවන් විදුලි බණ අපි ඇසුවෙමු. ඒ බණ දේශනා කළ පැවිදි උතුමන් වහන්සේලා බොහෝ වෙති. උන්වහන්සේලා සූත්‍රයක් දේශනා කොට ඊට අදාළ අටුවාව ගෙන හැර දක්වමින් ථේරවාදී මග යමින් ධර්මය දේශනා කළහ. ඒ බණබොහෝ දෙනා හඳුන්වන්නේ අමු බණ කියාය. එක පැත්තකින් ඒ කථාව නිවැරදිය. හොඳම රත්‍රං හඳුන්වන්නේ අමුරන් කියාය. ඒ නිසා හොඳම බණ අමුබණ යයි කීමේ වරදක් නැත. නමුත් අමුබණ කියා හඳුන්වන අය එසේ කියන්නේ ඒ අර්ථයෙන් නොවේ. කිසිම සිනහවක් හාස්‍යයක් නැති බණ යන අර්ථයෙනි. අද බොහෝ දෙනා බණට ආරාධනා කරන විටම කියන්නේ මිනිසුන්ට හිනාවෙන්න යමක් කිවයුතුයි කියායි. එවැනි සිනා බණ අද බොහෝ දෙනා හඳුන්වන්නේ කාලීන ධර්ම දේශනා යනුවෙනි. සමාජය තුළ පවත්නා කරුණු ධර්ම දේශනාවට ඇතුළත් කරමින් ධර්මය දේශනා කරනවිට සිනහ විය යුතු තැන සිනහව වරදක් කොට නොසලකමි. නමුත් එම සිනහවේ මාත්‍රාව අවබෝධ කරගත යුතුයි.

මෙම සූත්‍රයේදී බුදුන්වහන්සේ සද්ධර්මය අතුරුදහන් වීමට අදාළ කරුණු 5 උගන්වා ඇත. එම සද්ධර්ම අතුරුදහන් වීම සඳහා පිරිස් හතරක් වගකිව යුතුයි. ඒ පිරිස නම් භික්ෂු භික්ෂුනී උපාසක උපාසිකාවෝ ය. මේ පිරිස් හතරෙන් කවරෙකු ළඟ හෝ පහත සඳහන් කරුණු ක්‍රියාත්මක වේනම් ධර්මය අතුරු දහන්වෙයි.

01. සත්ථරි අගාරවා විහරන්ති අප්පතිස්සා
ශාස්තෘන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් හා යටත් පැවැතුම් නැතිවීම.

02. ධම්මෙ අගාරවා විහරන්ති අප්පතිස්සා
ධර්මය කෙරෙහි ගෞරවයක් හා යටත් පැවතුම් නැතිවීම.

03. සංඝෙ අගාරවා විහරන්ති අප්පතිස්සා
සංඝයා කෙරෙහි ගෞරවයෙන් හා යටත් පැවතුම් නැතිවීම.

04. සික්ඛාය අගාරවා විහරන්ති අප්පතිස්සා
ශික්ෂා පිළිබඳ ගෞරවයක් හා යටත් පැවතුම් නැතිවීම.

05. සමාධිස්මිං අගාරවා විහරන්ති අප්පතිස්සා.
සමාධිය පිළිබඳව ගෞරවයක් හා යටත් පැවතුම් නැතිවීම.

සද්ධර්මය අතුරුදහන්වීමට හේතුවන ඉහතකී කරුණු 5ම එකක් හැටියටද ගත හැකිය. ධර්මය යනු බුදුන්වහන්සේටම නමකි. බුදුන්වහන්සේ දැකීමට නම් ධර්මය දැකිය යුතුය කියන්නේ ඒ නිසාය. සංඝ යනුද බුද්ධ යන්නට සමානකළ හැකි වචනයකි. ගෝතමිය ඔය සිවුර සංඝයාට දෙන්න. එවිට මටද පූජා කළා මෙනි යනුවෙන් දේශනා කළේ ඒ නිසාය. ශික්ෂාවන් ඉදිරිපත් කළේ බුදුන්වහන්සේ නිසා යමෙකු තුළ ශික්ෂා ගෞරවය තිබීම බුදුන්වහන්සේට කරන ගෞරවයකි. චිතත සමාධියක් ඇති කොට ගෙන අන් අයද චිත්ත සමාධිය වෙත ළං කළ නිසා සමාධියට ගරු කිරීම බුදුන්වහන්සේට කරන ගෞරවයකි. මේ අනුව කිව හැක්කේ බුද්ධ ගෞරවය ඇති තැන සද්ධර්මය අතුරුදහන් නොවන බවයි.

සද්ධර්මය අතුරුදහන් නොකොට ආරක්ෂා කරගයුතු මේ වකවානුව තුළ ඉහතකී කරුණු 5 නිතර සිත්හි තබාගෙන කටයුතු කළ යුතුයි. ලෝකයේ ඉපිද ලෝකය තුළ හැදී වැඩී ලෝකයෙන් ඈත්ව ජීවත් වූ තථාගතයන් වහන්සේ උපමා කල හැක්කේ පියුමකටයි. එම උතුම් මිනිසා හැඳින්විය හැකි හොඳම වචනය බුද්ධ යන්නයි. ඒ නිසා එම බුදුරජාණන්වහන්සේගේ පද්මාකාර ජීවිතය හඳුනාගෙන බුද්ධ ගෞරවය ඇතිකර ගත යුතුයි. සමහරු නොදන්නාකම නිසා බුදුන්වහන්සේට අගෞරව වන ආකාරයේ කටයුතු කරන බව පෙනේ. බොහෝ දෙනා ව්‍යවහාර කරන ගෙදර බුදුන් අම්මා යන්නද එවැනි සකස්විය යුතු අදහසකි. අම්මා යනු ගුණ සමුදායකින් යුක්ත අයෙක් බවට වාදයක් නැත. නමුත් අම්මා යනු මිය පරලොව ගොස් නැවත තැනක උපදින කෙලෙස් සහිත අයෙකි. ඒ නිසා එවැනි කෙනෙකුට බුද්ධ යන වචනය යෙදීම බුදුන්වහන්සේට කරන අගෞරවයකි.

වර්තමානයෙහි අලුත් බුදුකෙනෙක් ලොවට පහළවී තිබේ. එම බුදුන්වහන්සේ හඳුන්වනේනේ ලාෆින් බුද්ධ කියායි. හිනාවෙන බුදුන්වහන්සේ යනු එහි අදහසයි. එම බුද්ධ ප්‍රතිමාව මහත් උදරයක් සහිතව නිර්මාණය කර තිබේ. එම ප්‍රතිමාවක් ගෙදරක තැන්පත් කර තිබීම සම්පත් ලැබීමට හේතුවක් බව කියයි. නමුත් එය ථේරවාදී බුදුදහමට නොගැලපෙන අදහසකි. අපේ බුදුරජාණන් වහන්සේ නිතරම සිනාසුනු කෙනෙකු නොවේ. එම නිසා ඉහත දැක්වූ ප්‍රතිමාවෙන් කෙරෙන්නේ  අපේ බුදුරජාණන්වහන්සේට අගෞරව කිරීමකි.

බුද්ධ ප්‍රතිමා සුලභ වීමද බුද්ධ ගෞරවයට හානියක් වී තිබේ. පසුගිය සුනාමි විපතත් සමගම පාරවල් අයින්වල බුද්ධ ප්‍රතිමා සකස් කිරීම විලාසිතාවක් බවට පත්වී තිබේ. බොහෝ තැන්වල එම ප්‍රතිමාවල ආවරණයක් ද නැත. සමහරු මුහුදු වෙරළේ ද එවැනි ප්‍රතිමා තැනීමට ඉදිරිපත් වෙති. එවැනි පිරිසක් තම විහාරස්ථානයට පැමිණ එහි ස්වාමීන්වහන්සේට ඒ කාරණය ඉදිරිපත් කළ විට උන්වහන්සේ කියා තිබුනේ වැල්ලේ කෙරෙන දේවල් අප දන්නා බැවින් එවැනි තැනක බුද්ධ ප්‍රතිමාවක් සකස් කිරීම නුසුදුසු බවයි. එය භික්ෂුවකගෙන් සිදුවිය යුතු වැදගත් අනුශාසනයකි. අද පාර අයින්වල බෝධින්වහන්සේලා ළ!ග කැඩුනු බුද්ධ ප්‍රතිමා සුලභව දක්නට ලැබේ. මිනිසුන් එම කැඩුනු ප්‍රතිමා කුණු ගොඩට විසි නොකොට එවැනි තැන්වල ගෙනත් තබන්නේද බුද්ධ ගෞරවය නිසායි. ඒ නිසා අපි බුද්ධ ගෞරවය ගැන සැලකිලිමත් විය යුතුයි.

සමහර විහාරස්ථානවල මෙන්ම ගිහිගෙවල් වලද බුද්ධ ප්‍රතිමාවට ඉහළින් පංසලේ නාහිමිවරුන්ගේ ඡායාරූප තැන්පත් කර තිබෙනු දැකිය හැක. ගෙවල්වල බුද්ධ ප්‍රතිමාවට ඉහළින් ගෙදර අයගේ ඡායාරූපය හෝ දේශපාලන නායකයින්ගේ ඡායාරූප සවිකර තිබේ. මේවා

ගැන අප සැලකිලිමත් විය යුතුයි. ගෙදරක හෝ පන්සලක බුද්ධ ප්‍රතිමාවක් තිබේ නම් ඊට ඉහලින් වෙනත් කිසිදු අයෙකුගේ ඡායාරූපයක් සවිනොකළ යුතුයි.

බුද්ධ පූජාව ගැනද සැළකිලිමත් විය යුතුයි. සමහර විහාරස්ථානවල හා සමහර ගෙවල්වල බුද්ධ පූජාව සඳහා පාවිච්චි කරන්නේ පංසලේ හෝ ගෙදර ඇති අපිරිසිදුම නොවටිනා භාජනයන්ය. මින්පසු  එසේ නොකිරීමට වගබලා ගත යුතුයි. පන්සලේ හෝ ගෙදර තිබෙන ඉතාම වටිනා ඉතාම පිරිසිදු භාජන බුද්ධ පූජාව සඳහා භාවිතා කළ යුතුයි. මෙසේ බුද්ධ ගෞරවයෙන් යුක්තව ක්‍රියා කිරීම තුළින් ධර්මය අතුරුදහන් නොවී රැක ගැනීමට හැකිවෙයි.

බුදුන්වහන්සේ දේශනා කළ ධර්මය ස්වාක්ඛාතය. එහි වෙනසක් කිරීමට තවම කෙනෙක් ඉදිරිපත් වී නැත. එම නිසා බුද්ධ රාජ්‍ය තුළ බුදුන්වහන්සේ ඉදිරිපත් කළ රාජකීය පණිවිඩය වෙනස් නොකරිමට වගබලා ගත යුතුයි. නූතනයේ සමහරු අත්තනෝමතිකව ධර්මයට විවිධ අර්ථ සැපයීමට ඉදිරිපත් වී තිබෙනු දැකිය හැක. ඒ සියළුම දෙනා ධර්මය යයි කියමින් පෙනී සිටින සද්ධර්ම ප්‍රතිරූපක හිස් පුරුෂයෝය. එවැනි අයගෙන් ප්‍රවේශම්ව ධර්මයට ගරුකිරීම ධර්මකාමීන්ගේ යුතුකම වෙති.

නූතනයේ ධර්ම දේශනා ඉතා සුලභය. ලංකාවේ තරම් බණ දේශනා කරන රටක් ලෝකයේ තවත් නැතුවා ඇත. ඒ නිසාද බොහෝදෙනා අතින් ධර්මයට අගෞරව වන දේ සිදුවෙයි. විවිධ මාධ්‍ය තුළ බණ දේශනාවන විට බොහෝ දෙනා ඒ පිළිබඳව කිසිදු සැලකිල්ලක් නැත. එයද ධර්මයට කරන අගෞරවයකි. අපේ පැරණි අය ගුවන්විදුලි බණ ඇසුවේද බිම වාඩිවී සිට ගෙනය. ඒ නිසා බණ දේශනා කරන තැන්වල ධර්ම ගෞරවය ඇතිකරගෙන බණ ඇසීමට සිතටගත යුතුය.

සංඝයාගේ දැකීම මංගල කරුණක්බව දක්වා තිබුනත් සමහරුන්ට එය අසුභ දර්ශනයක් වී තිබේ. ගමනක් යෑමට සූදානම් වූ අවස්ථාවක මුලින්ම භික්ෂුවක් ඉදිරියට පැමිණියොත් ඒ ගමන නොයන අය අප සමාජය තුළ දැකිය හැකිය. නූතන යුගයේ ජීවත්වන භික්ෂූන්වහන්සේලා රහතන්වහන්සේලා නොවන බව දනිමු. ඒ තත්වයට පත්වී ඇති භික්ෂූන්වහන්සේලා නැතැයි කියා අපි නොකියමු. එවැනි අඩුපාඩුකම් සහිත ජීවිත ගත කරන භික්ෂූන්වහන්සේලා දුටුවිට උන්වහන්සේලාට අගෞරව නොකළ යුතුයි. උන්වහන්සේලා කරගෙන තිබෙන දේ උන්වහන්සේලාම පරලොවට ගෙන යනු ඇත. අපට ඒ ගැන සිතන්නට උවමනාවක් නැත. අප සිතිය යුත්තේ මේ බුද්ධ ශ්‍රාවකයින් වහන්සේලා කියායි. එසේ ක්‍රියාත්මක වනවිට අඩුපාඩුකම් ඇති භික්ෂූන් වහන්සේලාද එම අඩුපාඩුකම් සකස්කර ගැනීමට සිතට ගනු ඇත.

බුදුන්වහන්සේ දේශනා කළ ශික්ෂාපද ගැන කිසිවෙකුට සැකයක් ඉපිදවිය නොහැකි සමාජය තුළ නිතර භාවිතාවන පංචසීල ශික්ෂාව ගෙන බැලුවොත් පෙනියන්නේ සමාජයේ යහ පැවැත්මට අදාළ ඉතාම වැදගත්  ශික්ෂා පද පහක් බවයි. ඒ තුළ සඳහන් වන්නේ මානව අයිතිවාසිකම් පහකි. එවා ආරක්ෂා උනොත් සමාජ අර්බුද නැතිවෙයි. සාමකාමී සමාජයක් උදාවෙයි. නමුත් මුදලට මුල් තැන ලැබී තිබෙන මෙම සමාජය තුළ බොහෝ දෙනා කියන්නේ පන්සිල් කඩකළ තරමට මුදල් ඉපයිය හැකි බවයි. නමුත් එසේ ලබන මුදලින් කිසිදාක තෘප්තිමත් ජීවිතයක් ගත කළ නොහැක. ඒ නිසා ශික්ෂා ගෞරවය ඇතිකරගෙන ක්‍රියාකිරීමට ගිහි පැවිදි සියලුම දෙනා සිත්හි තබා ගත යුතුයි.

*සද්ධර්මය අතුරුදහන්වීමට බලපාන පස්වන කාරණය සමාධියට අගෞරව කිරීමයි. භාවනාවෙන් සිත වැඩූ කෙනෙකුට චිත්ත සමාධියක් ලබා ගත හැකිය. එවැනි චිත්ත සමාධි ලැබූ අය නූතනයේදී සිටීමට පුළුවන. නමුත් සමාජයෙන් ඇසෙන සමහර පුවෘත්ති වලින් කියන්නේ මුදල් ගෙවා චිත්ත සමාධි ලබාගත හැකි බවයි. එවැනි සද්ධර්ම ප්‍රතිරූපකයන්ගෙන් මිදී සමාධිය පිළිබඳ ගෞරවයෙන් ක්‍රියා කළ හොත් අපිටද එවැනි චිත්ත සමාධියක් ලබාගත හැකිය.*

*මේ සියලු කරුණු සිත්හි තබාගෙන බුද්ධ ගෞරවයෙන් යුක්තව ක්‍රියා කරමින් සද්ධර්මය ආරක්ෂා කරගෙන ධර්මානුකූලව ජීවිතයක් ගත කිරීමට භික්ෂු භික්ෂුන් උපාසිකා උපාසිකා යන සිව්වනක් පිරිසම සිතට ගත යුතුයි. බිනර පෝය දිනයේ ඇතිකරගනු ලබන එම අධිෂ්ඨානයට*